**සීතාවක ප්‍රාදේශීය සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 22 දිනද විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 20 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී වාරික වශයෙන් අයකර ගැනීමේ පදනම මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති රු.11,934,000 ක් වටිනා කම්පැක්ටරයේ වටිනාකම අයකර ගත හැකි උපයෝගි සේවා ගිණුමට හා පළාත් සභා ණය ගිණුමට ගිණුම්ගතකර නොතිබුණි.<br><br>තවද 2018 මැයි මාසයේ සිට වාරික 20ක වටිනාකම වන රු.4,734,000 ක් සභාවට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් හිලව් කරගෙන ඇතත්, ඒ සඳහා අදාළ ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | නිවැරදිලෙස ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වීම. | විමසුම් පිලිගන්නා අතර 2020 වර්ෂයේදී ජ'නල් සටහන් මගින් අවසාන ගිණුමේ නිවැරදි කරන බව දන්වමි. |

#### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

----------------------

| | | |
|---|---|---|
| කළුඅග්ගල ග්‍රාමයේ විනෝද උයනක් පවත්වා ගෙන යන සමාගමක් විසින් විනෝද බදු නොගෙවීම මත ඊට එරෙහිව සභාව විසින් අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර, එම විනෝද උයන අයිතිකරු විසින්ද සභාවට එරෙහිව නඩුවක් ගොනුකර තිබුණි. මේ දක්වා එම නඩුව සමථයකට පත්වී නොතිබුණි. | අය විය යුතු විනෝද බදු අය කර ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතු වීම. | නඩු ගාස්තු ලෙස රු.84,000 ක් ගෙවා ඇති අතර මේ දක්වා නඩුව සමථයකට පත් කර තීන්දුව ලබා දී නොමැත.තීන්දුව ලබා දුන් වහාම ඒ අනුව කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

-------------------

1.4.1 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------

| නීති රීතී, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් | | |
|---|---|---|---|---|
| (අ)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 හා 128 වගන්ති | - | සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සුසාන භූමි 26 ක් හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුසාන භූමි 27 ක් පවරා ගැනීමේ කටයුතු නිම වී නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. | සීතාවක ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමිවලට අදාල අයිතිය සනාථ කිරීමේ පිඹුරුපත්, ඔප්පු, පැවරුම් ලිපි ප්‍රාදේශීය සභාව සතුව නොමැති බැවින් එම සුසාන භූමිවල අයිතිය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම්වරු වෙත ඉල්ලීම් කරන ලදි. ඒ අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් අධිකාරී වෙත කළ මැනුම් ඉල්ලීම් පිටපත් සීතාවක ප්‍රාදේශීය සභාවට එවා ඇත. ඒ අනුව සුසාන භූමි පවරා ගැනීම සඳහා සීතාවක හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධ වෙමින් ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | 6,124,904 | පළාත් පාලන ආයතන මඟින් අයකරනු ලබන සේවා ගාස්තු නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුමක තැන්පත්කර තිබුණද හඳුනාගත් ව්‍යාපෘතීන් සඳහා යොදාගෙන නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමේ පසු විපරම් කටයුතු කඩිනම් කිරීම සහ ඒ අනුව ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතු වීම. | නාගරික සංවර්ධන අධිකාරී තැන්පත් ගිණුමේ මුදලින් කළු අග්ගල වෙළඳ සංකීර්ණයේ යෝජිත වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා රු.4,995,000ක ඇස්තමේන්තුවක් 2020.08.10 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව ප්‍රකාශ කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.47,958,426 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.25,357,963 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැ.31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිගය |
| ............. | ..................... | ............. | ........... | ................. | ..................... | ............. | ......... | .............. |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| i. වරිපනම් හා බදු | 32,543 | 28,683 | 28,652 | 8,087 | 32,149 | 26,875 | 25,994 | 7,490 |
| ii. කුලී | 23,428 | 26,944 | 25,470 | 2,812 | 23,445 | 24,800 | 24,235 | 886 |
| iii. බලපත්‍ර ගාස්තු | 2,101 | 1,996 | 1,996 | - | 2,016 | 2,122 | 2,122 | - |
| iv.වෙනත් ආදායම් | 273,936 | 253,892 | 185,502 | 203,510 | 212,562 | 198,691 | 212,898 | 130,504 |
| එකතුව | 332,008 | 311,515 | 241,620 | 214,409 | 270,172 | 252,488 | 265,249 | 138,880 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම්<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ හිඟ වරිපනම් ශේෂය තුළ අවුරුදු 3 සිට 10 දක්වා කාලයට අදාළ හිඟ ශේෂය රු.2,075,876ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු වීම. | අවුරුදු 3 – 10 අතර හිඟ ශේෂය තුල පවතින රු: 324,794.46 ක මුදල හඳුනාගත නොහැකි පැරණි ශේෂ වන අතර කීප වරක් සමීක්ෂණ කර අයකර ගැනීමට නොහැකි බවට හඳුනාගෙන කපා හැරීම සඳහා සභා අනුමැතියක් ලබාගෙන පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර ඇත. ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ආ) **අක්කරබදු**

-----------

| | | |
|---|---|---|
| පාදුක්ක උපකාර්යාලයේ 2019දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු රු.48,561 ක් වූ අතර ඉන් රු.32,725ක් වසර 10 කට වඩා වැඩි කාලයකට අදාල විය. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු වීම. | ඉතිරි හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමින් පවතී. |

**2.2.3** **උසාවි දඩ**

-----------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2017,2018 සහ 2019 වර්ෂවලට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.35,419,847ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු වීම. | 2017 ජුලි සිට දෙසැම්බර් දක්වා සහ 2018 වර්ෂයට අදාල උප ලේඛන සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බැවින් හැකි ඉක්මනින් 2018 හා 2019 වර්ෂයන්ට අදාල උසාවි දඩ මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.2.4** **ලැබිය යුතු පළාත් සභා ආධාර**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාව වෙත ලැබිය යුතු පළාත් සභා ආධාර වටිනාකම රු.24,858,076 ක් වූ අතර එයින් රු.6,403,031ක් වර්ෂ1 සිට 5 දක්වා අතර කාලයක් සඳහා අදාළ ලැබිය යුතු ශේෂයක් විය. | ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **කාර්යසාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සීතාවක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේදී ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත, වටිනාකම රු.25,616,233 ක් වූ කර්මාන්ත 55 -ක් 2019 දෙසැම්බර් 31 දින වන විටද වැඩ නිමකර නොතිබුණි. | ඉදිකිරීම් කර්මාන්ත සැලසුම්කල ආකාරයට ආරම්භ කර අවසන්කල යුතු වීම. | සීතාවක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ දී ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත ව්‍යාපෘති 55 වටිනාකම රු.25,616,233කි. |

(ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නේවාසික කලාපයක් මධ්‍යයේ පවත්වාගෙන යන වාහන අළුත්වැඩියා, නඩත්තු හා පින්තාරු කිරීමේ මධ්‍යස්ථානයකින් සිදුවන ශබ්ද දූෂණය හා ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට සිදුවන අහිතකර තත්ත්වය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුව නොතිබුණි. | අප්‍රමාදව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නේවාසික කලාපයක් මධ්‍යයේ පවත්වා ගෙන යනු ලබන වාහන අලුත්වැඩියා, නඩත්තුව, පින්තාරු කිරීමේ මධ්‍යස්ථානයට එරෙහිව අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 54527 යටතේ නඩුවක් ගොනු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ද්විතික මට්ටමේ තනතුරු 06 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි. | අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුවීම. | එම තනතුරු පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති අතර එම පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 01 වන දින සිට හංවැල්ල නව වෙළඳ සංකීර්ණය සහ හංවැල්ල පැරණි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කුලී නැවත තක්සේරු කර තිබූ අතර නව තක්සේරු මුදල කඩහිමියන් ප්‍රතික්ෂේප කිරීම නිසා නව කඩ තක්සේරු කුලිය හා පැරණි කඩකුලී මුදල අතර වෙනස වූ රු.3,877,650 ක් සභාවට අහිමි වී තිබුණි. | සංශෝධිත තක්සේරු වටිනාකමට කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2018.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හංවැල්ල නව වෙළෙඳ සංකීර්ණයේ කඩ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර ඇති කඩ කුලී ප්‍රතික්ෂේප කරමින් කඩහිමියන්ගේ අභියාචනා ඉදිරිපත් කර තිබූ අතර, එම අභියාචනා තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමෙන් පසු ඉහත කී තක්සේරුව සංශෝධනය කර ඒවා තිබුණි. නමුත් එම සංශෝධිත තක්සේරුව සභා සම්මත නොවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබූ අතර , 2020.08.10 දින පැවති මහා සභාවේ දී සභා සම්මත වී ඇත.<br>ඒ අනුව 2018.11.01 දින සිට සංශෝධිත කඩ කුලී තක්සේරුවට අනුව හිඟ කඩ කුලීය රු.3,877,650 ක් ද සමඟ කඩ කුලී අය කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වටිනාකම රු.773,359,759,927ක් වූ පොදුපහසුකම් ඉඩම් 137ක මායිම් හඳුනාගෙන ආරක්ෂක ක්‍රියාමාර්ග ගෙන නාම පුවරු සවිකර සංවර්ධනය කිරීමට පියවරගෙන නොතිබුණු අතර මායිම් හඳුනාගත් පොදු පහසුකම් ඉඩම් 37ක් සංවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් මායිම් හඳුනාගෙන නාම පුවරු සවි කර සංවර්ධනය කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම කළ හංවැල්ල සතිපොළ නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා එහි පූර්ණ අයිතිය සභාවට පැවරී නොතිබීම හේතුවෙන් හංවැල්ල පොළ | පවරා ගැනීමේ කටයුතු සහ ඒ පිළිබඳ පසු විපරම් කඩිනම් කළ යුතු වීම. | නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ 2020.07.10 දින පවත්වන ලද සාකච්ඡාවේදී ද හංවැල්ල සතිපොළෙහි ඉතිරි කඩ 100 ද ඉදිකිරීමෙන් පසු සභාව වෙත පවරා දීමට තීරණය කර |

| | | |
|---|---|---|
| මෙතෙක් එම භූමියේ ස්ථානගත කිරීමට නොහැකිව පැවතුණි. | | ඇත. |
| (ආ) හෙක්ටයාර් 2.9425 ක භූමි ප්‍රදේශයක පිහිටා ඇති පාදුක්ක සතිපොළ හා පාදුක්ක ක්‍රීඩාංගණය මෙතෙක් පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සහ ඒ පිළිබඳ පසු විපරම් කඩිනම් කළ යුතු වීම. | මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය වෙත වාචිකව විවිධ අවස්ථාවල ඉල්ලීම් ඉදිරිපත් කරන ලද අතර මෙම භූමිය ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සම්බන්ධයෙන් 2020.07.10 දින නාගරික සංවර්ධන අධිකාරියේ පැවති සාකච්ඡාවේදී පාදුක්ක වෙළඳපොලෙහි භුක්තිය හා පාදුක්ක ක්‍රීඩාපිටියේ අයිතිය සීතාවක ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් සංවර්ධන අංශය වෙත උපදෙස් ලබාදෙන ලදි. |

**3.4.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තුන්නාන සුසාන භූමියේ රු.21,589,738ක් වැයකර ඉදිකළ ආදාහනාගාරය, විවෘත නොකර වසරකට වැඩි කාලයක සිට නිශ්ක්‍රියව පැවතුණි. මෙහි සවිකර ඇති අධිබල විදුලි උත්පාදන යන්ත්‍රයට අකුණු සැර වැදී ඇතත් එය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | විදුලි ජෙනරේටරය නොපමාව අළුත්වැඩියා කර මහජන සුබසාධනය සඳහා යෙදවිය යුතු වීම. | ජෙනරේටරය අළුත්වැඩියා කිරීම සඳහා අදාල කොන්ත්‍රාත් ආයතනය මගින් මිල ගණන් ඉදිරිපත් කර ඇත. |

**4 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | 2019 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කර ඇති අතර වරින්වර කාර්යාල හා විවිධ අංශ පරීක්ෂා කර නිවැරදි ලිපි ලේඛන පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. |

## 4.2 පළාත් ගිණුම්කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 ජුනි 14 දින පැවති පළාත් ගිණුම්කාරක සභාව විසින් 2013 විගණකාධිපති වාර්තාවේ 1:3:3(අ) ඡේදය සම්බන්ධයෙන් දී තිබූ නියෝගය 2019 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිණුම් කාරක සභා නියෝග අප්‍රමාදව ඉටු කළ යුතු වීම. | ධාවනයට නුසුදුසු තත්වයේ පවතින අංක RA - 7616 දරණ ට්‍රැක්ටරය වෙන්දේසි කිරීම සඳහා 2020.02.28 දින දෙවැනි වරට ද පුවත්පත් දැන්වීම් පල කළ නමුත් මේ දක්වා එකදු මිල ගණනක් හෝ ලැබී නොමැත. එබැවින් එම ට්‍රැක්ටරය ප්‍රසිද්ධ වෙන්දේසියක් විකිණීම සුදුසු බවට 2020.02.28 දින මුදල් කමිටුව තීරණය කර ඇත. ධාවනයට නුසුදුසු තත්වයේ පවතින අංක SL - 7792 දරණ අත් ට්‍රැක්ටරය මිල දී ගෙන වර්ෂ 10 ක් ඉක්ම ගොස් නැති බැවින් අපහරණය කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ (බ.ප) අනුමැතිය ඉල්ලා ඇත. නමුත් මේ දක්වා ඊට අනුමැතිය ලැබී නොමැත. |